**රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

අංක 2462 දරන 2025 නොවැම්බර් මස 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද "ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025" විභාග නිවේදනයේ, **7.0 සුදුසුකම් ඡේදයේ (ඇ) කොටස** පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

7.0 සුදුසුකම් :

(ඇ) 2025.12.08 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2007.12.08 දිනට හෝ ඊට පෙර හා 1990.12.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

02. ඉහත සංශෝධනය මෙම විභාග අවස්ථාවට පමණක් අදාළ වන බව සැලකිය යුතු ය. එසේම අයදුම්කරුවන් තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025.12.08 දින වන විට සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් කර ගැනීමේ අවසාන දිනය 2026.08.28 තෙක් දීර්ඝ කරනු ලැබේ. මේ වනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන්ට මෙම සංශෝධනය හේතුවෙන් නැවත අයදුම්පත් යොමු නොකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජූලි මස 22 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 19